රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 132

මගේ අංකය: 543 ජ්. 603 වි
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7.
1978 නොවැම්බර් මස 15 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## වැටුප් සමාලෝචන කමිටුව.

ජනාධිපති උතුමාණන් පහත සඳහන් විෂයයන් විමර්ශනය සඳහා වැටුප් සමාලෝචන කමිටුවක් පත් කොට ඇත.

(අ) රජයේ සේවයේ වැටුප් ව්‍යුහය, දීමනා හා අනිකුත් විධියේ ගෙවීම්, අනුග්‍රහ හා අදාළ දේ ගැන පහත සඳහන් කරුණු පිළිබඳව සැලකිලිමත් වෙමින් සමාලෝචනය කිරීම.

(I) රජයට ලබාගත හැකි මූල්‍ය සම්පත්.

(II) ජීවන වියදම.

(III) රාජ්‍ය අංශයේ සියලුම කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා පරිපාලන, වෘත්තීය, විද්‍යාත්මක සහ කාර්මික කුසලතාවන්ගේ විශේෂඥතා දැනුමක් ලබා ගැනීම සඳහා වන වැඩි අවශ්‍යතාවට ඉඩකඩ සැලසීම අවශ්‍ය වීම සහ එකී කුසලතා වලට කිසි තැනක් දී ප්‍රමාණවත් ලෙස පාරිශ්‍රමික ගෙවීම පිළිබඳව වගබලා ගැනීමේ අවශ්‍යතාවය.

(IV) ඇතැම් වෘත්තීය ශ්‍රේණි, පොලිස් හා සන්නද්ධ සේවාවන්ට දී ඇති අනුග්‍රහ ගෙවීම්වල තත්කාල වශයෙන් කළ වැඩිවීම්.

(ආ) රාජ්‍ය සේවයේ වැටුප්, දීමනා හා වෙනත් ආකාරයේ පාරිශ්‍රමිකයන් හා අනුග්‍රහ පරිපූර්ණ වශයෙන් ප්‍රතිශෝධනය කිරීමටත් නිර්ණය විෂයන්ට අනුෂංගික වූ වෙනත් කරුණු පිළිබඳවත් නිර්දේශයන් ඉදිරිපත් කිරීම.

2. මෙම කමිටුවේ සමාලෝචනයට නියමිත විෂය ක්ෂේත්‍රයට ගැනෙන දීමනා හෝ කරුණු ගැන, මෙම කමිටුවෙන් පූර්ව විමසුමක් කොට අනුමැතිය ලබාගෙන මිස කිසිම පියවරක් නොගැනීමට කරුණාකර වගබලා ගනු මැනවි.

3. එවැනි කිසිම කරුණක් සමාලෝචනය කිරීම මෙම අමාත්‍යාංශයට ද භාර ගත නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

Siriwardhana
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

පිටපත: වැටුප් සමාලෝචන කමිටුවේ ලේකම්.

ජ/15-